**කෘෂිකාර්මික හා ගොවිජන රක්ෂණ යෝජනා ක්‍රමය - 2019**

--------------------------------------------------------------------

## 1.1 තත්ත්වාගණනය කළ මතය

කෘෂිකාර්මික හා ගොවිජන රක්ෂණ යෝජනා ක්‍රමයේ 2019 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මාගේ වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණුවලින් වන බලපෑම හැර, යෝජනා ක්‍රමයේ 2019 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

## 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, යෝජනා ක්‍රමය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරිත්වය යෝජනා ක්‍රමය ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා යෝජනා ක්‍රමයේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

යෝජනා ක්‍රමයේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, යෝජනා ක්‍රමයේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යාම අවශ්‍ය කෙරේ.

## 1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතික වීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවිය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බව අපේක්ෂා කෙරේ.
මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදි. තවද,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවන්නාවූ අවදානම් මඟහරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබාගැනීම මාගේ මතයට පදනම් වේ. වරදක් නිසා සිදුවන බලපෑමට වඩා වංචාවක් හේතුවෙන් සිදුකරන ලද ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයක් හඳුනා නොගැනීම මගින් සිදුවන්නාවූ බලපෑම ප්‍රබල වන අතර, දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මඟහැරීම හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.

- අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස සමාගමේ අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අවබෝධයක් ලබා ගන්නා ලද නමුත්, අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය සහ යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල හා සම්බන්ධිත හෙළිදරව් කිරීම්වල සාධාරණත්වය ඇගයීම.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් සමාගමේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාළත්වය තීරණය කරන ලදි. ප්‍රමාණවත් අවිනිශ්චිතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම්වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව් කිරීම ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතු වේ. මාගේ නිගමනයන් විගණකගේ වාර්තාවේ දිනය දක්වා ලබා ගන්නා ලද විගණන සාක්ෂි මත පදනම් වේ. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් විය හැකිය.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගයීම.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ යෝජනා ක්‍රමයේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ යෝජනා ක්‍රමයේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, යෝජනා ක්‍රමය ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නිතීරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

## 1.5 මූල්‍ය ප්‍රකාශන

### 1.5.1 ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම

| අනුකූල නොවීම | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 37 හි 59 වන ඡේදය ප්‍රකාරව, සක්‍රිය දායකයන් හඳුනා ගැනීම සහ ආයු ගණක තක්සේරුව කාලානුරූපීව සිදු කළ යුතු වුවද එසේ කිරීමෙන් තොරව 2019 දෙසැම්බර් 31 දිනට ගොවීන්ගේ මරණ පාරිතෝෂික අරමුදල සඳහා රු.19,016,134 ක ප්‍රතිපාදනයක් මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි. | දැනට ගොවි විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය නව දායකයින් බඳවා ගැනීමකින් තොරව ක්‍රියාත්මක වන බැවින්, ආයු ගණක තක්සේරුවක් සිදුකර නොමැති අතර, ඉදිරියේදී විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය ප්‍රතිව්‍යුහගත කිරීමත් සමග ආයුගණක තක්සේරුව නියමිත පරිදි සිදු කිරීමට බලාපොරොත්තු වේ. | ආයු ගණක තක්සේරුව කාලානුරූපීව සිදු කළ යුතුය. |

### 1.5.2 ගිණුම්කරණ අඩුපාඩු

| අනුකූල නොවීම | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| මහියංගනය, ඇඹිලිපිටිය සහ අනුරාධපුරය යන දිස්ත්‍රික්කයන්හි පවත්වාගෙන යන නිල නිවාසයන්හි යෝජනා ක්‍රමයට අයත් පර්චස් 76.6 ක ඉඩම් වටිනාකම තක්සේරුකර ගිණුම් වලට ගෙන නොතිබුණි. එසේම 1986 ජාතික නිවාස සංවර්ධන අධිකාරියෙන් සින්නක්කරව පවරන ලද ඇඹිලිපිටිය නිල නිවසේ ගොඩනැගිලි වටිනාකම තක්සේරු කර ගිණුම්ගත කර නොතිබුණි. | මහියංගනය, ඇඹිලිපිටිය හා අනුරාධපුරය යන නිල නිවාසයන්හි ඉඩම් වල වටිනාකම හා ඇඹිලිපිටිය නිල නිවාසයේ වටිනාකම තක්සේරු කර ගැනීම සම්බන්ධයෙන් මේ වන විට දිස්ත්‍රික් නියෝජ්‍ය/ සහකාර අධ්‍යක්ෂකවරුන් සමග සාකච්ඡා කර අවශ්‍ය කටයුතු ආරම්භ කර ඇති අතර, කඩිනමින් එම කටයුතු අවසාන කර තක්සේරු වටිනාකම ගිණුම්ගත කිරීමට කටයුතු කරනු ලැබේ. | වටිනාකම තක්සේරුකර ගිණුම්ගත කිරීමට කටයුතු කළ යුතුය. |

## 1.6 ලැබිය යුතු සහ ගෙවිය යුතු ගිණුම්

### 1.6.1 ලැබිය යුතු මුදල්

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) වසර 5 – 25 අතර කාලයක සිට පැවත එන එකතුව රු.692,302 ක් වූ සේවක ණය සහ අත්තිකාරම් සේවක පාරිතෝෂිතයෙන් හෝ ඇප කරුවන්ගෙන් කාලීනව අයකර ගැනීමකින් තොරව ගිණුම් වල ඉදිරියට එමින් පවතී. | මණ්ඩලයේ සේවයෙන් ඉවත් වී ගිය/ විශ්‍රාම ගිය නිලධාරීන්ගේ, ගෙවීම් පැහැර හැර ඇති ණය ශේෂයන් හා පොළී මුදල් අයකර ගැනීම සඳහා එන්තරවාසි යවා ඇති අතර, ඒ අනුව ගෙවීම් නොකලහොත් ඉදිරියේදී ඒ සඳහා අධිකරණ ක්‍රියාමාර්ග ගැනීමට නියමිතය. තවද, මෙසේ පැහැර හැර තිබූ බොහෝ නිලධාරීන්ගේ ණය ශේෂයන් ඔවුන් සේවක අර්ථසාධක අරමුදල් ලබාගැනීම සඳහා අවශ්‍ය ලිපිලේඛන ලබාගැනීමට මණ්ඩලය වෙත පැමිණෙන අවස්ථාවලදී අයකර ගැනීමට කටයුතු කළ අතර, අනෙකුත් නිලධාරීන්ගේ ණය ශේෂයන් ඇපකරුවන් මගින් අයකර ගැනීමටත් කටයුතු කරමින් පවතී. | ණය මුදල් අදාළ නිලධාරීන්ගෙන් අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ආ) වසර 5-15 අතර කාලයක සිට ඉදිරියට එමින් පැවතුණු එකතුව රු.708,347ක ප්‍රතිපූර්ණය කරගත යුතු වැටුප් , වැටුප් අත්තිකාරම් හා මිශ්‍ර ණයගැති ශේෂයන් නිරවුල් කර ගැනීමකින් තොරව ගිණුම් වල ඉදිරියට එමින් පවතී. | මණ්ඩලයට විවිධ පාර්ශවයන්ගෙන් ලැබිය යුතු රු.708,347ක මෙම ශේෂය අදාළ පාර්ශවයන්ගෙන් අයකර ගැනීම සඳහා දැනටමත් කටයුතු සිදුකරමින් පවතී. | අදාළ පාර්ශවයන්ගෙන් අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ඇ) 2019 යල කන්නයට වාර්තාගත විය හැකි මුළු වන්දි වටිනාකම වූ රු.මිලියන 1,284 හි මුල් රු.10,000 ගෙවීම සඳහා රු.මිලියන 613ක් රක්ෂණ භාර අරමුදලින් ලැබී තිබුණි. 2019 යල කන්නය සඳහා රක්ෂණ භාර අරමුදල සමඟ ඇතිකරගත් ප්‍රතිරක්‍ෂණ ගිවිසුම අනුව මෙම මණ්ඩලයේ වගකීම වූ රු.මිලියන 359 ඉවත්කළ පසු රක්ෂණ භාර අරමුදල වෙතින් තව දුරටත් ලබා ගතයුතු රු.මිලියන 312ක හිඟ මුදල මෙතෙක් ලබා ගැනීමට කටයුතු කර නොතිබුණි. | 2019 යල කන්නය සඳහා ප්‍රතිරක්ෂණය යටතේ ලැබිය යුතු රක්ෂණ වන්දි මුදල් ලබාදෙන ලෙස අවස්ථා ගණනකදී ඔවුන්ට ලිඛිතව මෙන්ම වාචිකවද දැනුවත් කර ඇති අතර, මේ පිළිබඳව මහා භාණ්ඩාගාරය හා ජාතික රක්‍ෂණ භාර අරමුදල සමග සාකච්ඡා කර ඇත. එහිදී මේ සම්බන්ධයෙන් ඉදිරියේදී අවශ්‍ය පියවර ගන්නා බව අපවෙත දැනුම් දී ඇත. | අදාළ හිඟ මුදල් කඩිනමින් ලබා ගැනීමට කටයුතු කළ යුතුය |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු.702,186,913 ක අතිරික්තයක් වූ අතර ඊට අනුරූප ඉකුත් වර්ෂයේ අතිරික්තය රු. 978,995,887 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.276,808,974 ක අඩුවීමක් නිරීක්ෂණය විය. මෙම අඩුවීමට 2019 වර්ෂයයේ යල හා මහ කන්න වෙනුවෙන් වන්දි ගෙවීම සඳහා මහා භාණ්ඩාගාරයෙන් ලද වාරික මුදල් 2018 වර්ෂයට සාපේක්ෂව රු.460,120,000 ක මුදල් ප්‍රමාණයක් අඩුවී තිබීම හා ප්‍රතිරක්ෂණ වාරික ගෙවීම පසුගිය වසරට සාපේක්ෂව රු. 328,582,848 කින් වැඩි වීම ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

## 3. මෙහෙයුම් සමාලෝචන

### 3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) කෘෂිකර්ම අමාත්‍යාංශ ලේකම් විසින් 2019 සැප්තැම්බර් 02 දින නිකුත් කරන ලද චක්‍රලේඛ අංක 07/2017 (සංශෝධන 11) නව චක්‍රලේඛය ප්‍රකාරව 2019/20 මහ කන්නයේ සිට වගා හානි වෙනුවෙන් වන්දි මුදල් ගෙවන අවස්ථාවේදී හදිසි අනතුරු රක්‍ෂණ ආවරණ සඳහා වාරික මුදලක් අයකර ගැනීම සඳහා කොන්දේසි හා නියමයන් ඇතුළත් විධිමත් වැඩසටහනක් පිළියෙල කර නිකුත් කළ යුතු වුවත්, මෙතෙක් එය සිදුකර නොතිබුණි. | කෘෂිකර්ම අමාත්‍ය ලේකම් 2019.09.02 දින නිකුත් කරන ලද චක්‍රලේඛ පරිදි 2019/20 මහ කන්නය සිට වන්දි හිමි ගොවීන්ගෙන් වන්දි මුදලින් රක්‍ෂණ වාරිකය අඩු කිරීමට යටත්ව හදිසි අනතුරු ඔප්පුවක් ලබා දීමට තිබුණද වන්දි ගණනය කරන අවස්ථාව සහ වන්දි මුදල් නිදහස් කරන අවස්ථාව වන විට රටෙහි පැවති කොරෝනා වසංගතය පිලිබඳ අවධානය යොමු කර මෙවැනි අවස්ථාවක වන්දි මුදලින් වාරික මුදලක් අඩුකිරීම සුදුසු නොවන බවට කලමණාකාරිත්වය තීරණය කළ බැවින් ඒ පිළිබඳව අධ්‍යක්‍ෂ මණ්ඩලය දැනුවත් කරන ලදී.<br>ඒ අනුව 2019/20 මහ කන්නය සඳහා මෙය ක්‍රියාත්මක නොකිරීමටත් ඉදිරි කන්නය සිට චක්‍රලේඛ පරිදි ක්‍රියාත්මක කිරීමටත් අනුමත කර ඇත.<br>ඒ අනුව 2020 යල කන්නය සිට හදිසි අනතුරු රක්‍ෂණ ඔප්පුව නිකුත් කිරීමට නියමිතය. | චක්‍රලේඛ නියමයන් පරිදි විධිමත් වැඩ පිළිවෙලක් සකස් කිරීමට පියවර ගත යුතුය. |
| (ආ) පරිගණක තාක්‍ෂණය යොදා ගනිමින් මුළු දිවයිනේම ගොවීන්ගේ තොරතුරු ඇතුළත් දත්ත පද්ධතියක් සකස්කළ යුතුබව සංයුක්ත සැලසුමේ දක්වා තිබුණද සමාලෝචිත වර්ෂය අවසන් වන | මේ වන විට එයට අදාළ මෘදුකාංගය ජාත්‍යාන්තර මූල්‍ය සංස්ථාවේ (IFC) සහයෝගයෙන් සකස් කර අවසන් කර ඇත. මෘදුකාංග පද්ධතිය හා දත්ත ගබඩාව සඳහා සම්පූර්ණ තාක්ෂණික සහයෝගය ජාත්‍යන්තර | සකස් කරන ලද මෘදුකාංගය භාවිතා කර කඩිනමින් දත්ත පද්ධතිය සකස් කළ |

| | | |
|---|---|---|
| විටත් එය සකස් කර නොතිබුණු අතර එම දත්ත ගබඩා කිරීම සඳහා මෘදුකාංග පද්ධතියක්ද මෙතෙක් මිලදී ගෙන නොතිබුණි. | මූල්‍ය සංස්ථාව මගින් ලබාදෙනු ලැබේ. දත්ත ගබඩාව සඳහා තොරතුරු ඇතුළත් කිරීම මේ දිනවල ක්ෂේත්‍ර මට්ටමින් සිදු කෙරෙමින් පවතී. | යුතුය. |

### 3.2. අනාර්ථික ගණුදෙනු

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2008 ජුනි 04 දින ශ්‍රී ලංකා ඉඩම් ගොඩකිරීමේ හා සංවර්ධනය කිරීමේ සංස්ථාවට මණ්ඩලය විසින් කාර්යාල ගොඩනැගිල්ලක් ඉදිකිරීම් සැලසුමකට ගෙවා තිබූ රු.565,800 ක මුදල නැවත ප්‍රතිපූර්ණ කළ නොහැකි බව එම ආයතනය දන්වා තිබුණ ද ව්‍යාපෘතිය අත්හැරීම නිසා ගෙවූ මුදල අනාර්ථික වුවත් එය ප්‍රාග්ධන අත්තිකාරම් ලෙස ජංගම වත්කම් යටතේ පෙන්වා තිබුණි. | ඉදිරි වර්ෂය තුළ දී මණ්ඩලයේ ප්‍රධාන කාර්යාලය ගොඩනැගීම සඳහා සැලසුම් සකස් කර ඇති අතර අදාළ භූමිය වෙන් කර ගැනීමෙන් පසු ශ්‍රී ලංකා ඉඩම් ගොඩකිරීමේ හා සංවර්ධනය කිරීමේ සංස්ථාව විසින් මූලික බිම් නිර්මාණය කරදීම ඉටුකරගැනීමට කටයුතු කරනු ඇත. කාර්ය ඉටුවන තෙක් එය ප්‍රාග්ධන අත්තිකාරමක් ලෙස දක්වනු ඇත. | ප්‍රධාන කාර්යාල ගොඩනැගිල්ල කඩිනමින් ඉදි කර ගැනීමට කටයුතු කළ යුතුය. |

### 3.3 මෙහෙයුම් අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) අනිවාර්ය බෝග වර්ග 6ක් වෙනුවෙන් ක්‍රියාත්මක නොමිලේ රක්ෂණයේදී වන්දි වටිනාකම ඉහළ යා හැකියැයි අපේක්ෂාවෙන් ආයතනය මැලේසියානු සමාගමක් සමඟ 2018 අප්‍රේල් 01 සිට 2019 මාර්තු 31 දක්වා ප්‍රතිරක්ෂණ ගිවිසුමකට එළඹ තිබුණි.පසුගිය වසර කිහිපයක මහ බැංකු හානි වාර්තා අනුව උපරිම රක්ෂණ වගකීම් වටිනාකම රු.5,000,000,000 ක් පමණ වූ අතර ඒ සඳහා වන ප්‍රතිරක්ෂණ වටිනාකම රු.3,500,000,000 ක් වේ.මහ බැංකු වාර්තාවේ දත්ත නිවැරදිව යොදා නොගෙන රක්ෂණ වගකීම් වටිනාකම රු.7,500,000,000 ක් ලෙස තීරණය කර රු.5,315,000,000 ක ප්‍රතිරක්ෂණ වගකීමට ආයතනය එළඹ තිබීම නිසා රු.675,000,000 ක් ප්‍රතිරක්ෂණ වාරික ලෙස ගෙවීමට | පැවති දේශගුණික තත්වය තුළ දැඩි අවදානමක් හටගෙන තිබුණු බැවින් හා මෙම තත්වයෙහි පෙර පැවති කන්න හා සසඳන විට දැඩි අවධානමක් ඇති බැවින් ප්‍රතිරක්ෂණය ලබාගෙන ඇත. මෙම ප්‍රතිරක්ෂණය සඳහා පදනම් වූයේ රක්ෂණ ක්‍රියාපටිපාටියට අනුව පුරෝකථනය කරන ලද වගකීමකි. එසේ බලාපොරොත්තු වූ පරිදි හානියක් සිදු වූයේ නම් ප්‍රතිරක්ෂණයෙන් හානි පුරණය කිරීමට හැකිවනු ඇත. මෙම ප්‍රතිරක්ෂණය ලබා ගැනීමේදී කැබිනට් මණ්ඩලය අනුමත ටෙන්ඩර් මණ්ඩලයක් මගින් හා ක්ෂේත්‍රයේ ප්‍රවීණයන්ගෙන් සැදුම්ලත් තාක්ෂණික කමිටුවක් මගින් මෙය සිදු කිරීමට කටයුතු කර ඇති අතර රක්ෂණ ක්‍රමවේදය තුළ කටයුතු කර ඇති නිසා මෙම වාරික මුදල නිෂ්කාර්යය වියදමක් ලෙස හඳුනා ගත නොහැක. මණ්ඩලයේ පාලනයෙන් බැහැර | අවධානම නිවැරදිව තක්සේරු කර ආයතනයට ප්‍රතිලාභ ලැබිය හැකි පරිදි ප්‍රතිරක්ෂකයකු සමඟ ගිවිසුම් ගතවීමත් කළ යුතුය. |

සිදුව තිබුණි.
ප්රතිරක්ෂණ ගිවිසුම අනුව වාර්තා වන හානි වටිනාකමින් රු.2,185,000,000ක් දක්වා වන්දි ගෙවීම් කෘෂි රක්ෂණ මණ්ඩලය විසින් ගෙවීමෙන් පසුව ප්‍රතිරක්ෂණයට යාමට හිමිකම පවති. එහෙත් 2018 යල හා 2018/19 මහ වෙනුවෙන් වාර්තා වූ මුළු වන්දි වටිනාකම රු.1,016,824,823ක් පමණක් වීමෙන් ප්‍රතිරක්ෂණයෙන් කිසිදු වන්දි මුදලක් ලබා ගැනීමට මණ්ඩලයට නොහැකි විය.
මුළු රක්ෂණ වගකීම් වටිනාකම පසුගිය හානි දත්ත අනුව ආසන්නව තක්සේරු කළේනම් විදේශීය ප්‍රතිරක්ෂණ සමාගම වෙත ගෙවන ලද රු.473,032,000ක මුදල අඩුකර ගත හැකිව තිබූ බව නිරීක්ෂණය විය.

කාලගුණික හා වෙනත් හානි සම්බන්ධයෙන් වඩා නිවැරදි පුරෝකථනයක් කිරීමේ හැකියාවක් නොමැති වීමේ හේතුව නිසාත්, බලාපොරොත්තු වූ පරිදි හානි වාර්තා නොවූ නිසාත්, ප්‍රතිරක්ෂණයෙන් අපේක්ෂිත ප්‍රතිලාභ ලැබී නොමැත.

(ආ) කෘෂිකර්ම අමාත්‍යාංශය මගින් ක්‍රියාත්මක කරනු ලබන ශ්‍රී ලංකාව සඳහා ඩිජිටල් ආර්ථික උපාය මාර්ගය සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතිය යටතේ කෘෂිකාර්මික හා ගොවිජන රක්ෂණ මණ්ඩලය හරහා මධ්‍යගත කෘෂිකාර්මික තොරතුරු පද්ධතිය ගොඩනැංවීමට සැලසුම් කර තිබුණි. ගම්පහ හා බදුල්ල දිස්ත්‍රික්කයන් මූලික කර ගනිමින් ගොවීන්ගේ තොරතුරු ඇතුළත් දත්ත පද්ධතියක් ගොඩනැංවීම, ශ්‍රී ලංකාව සඳහා ගොවිබිම් හඳුනා ගැනීම හා ඒවා පරිගණක ගත කිරීමේ නියමු ව්‍යාපෘතිය ක්‍රියාත්මක කර තිබුණි. ගම්පහ දිස්ත්‍රික්කය සඳහා ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව මගින් සකස් කර ඇති දත්ත පාදම යොදාගැනීමට අපේක්ෂා කළද මණ්ඩලය මගින් ව්‍යාපෘතිය කරගෙන යාමේදී එම දත්ත පද්ධතිය ඍජුවම අදාළ කරගත නොහැකිවීම පිළිබඳ හඳුනාගත් දූර්වලතා, කෘෂිකර්ම පර්යේෂණ නිලධාරින්ගෙන් ඇතිවූ විරෝධතා හා ඇතිවූ මූල්‍යමය

මෙම ව්‍යාපෘතීන් නවතා දැමීමක් සිදුවී නොමැති අතර, ගම්පහ හා බදුල්ල දිස්ත්‍රික්ක වල සිදු කරන ලද මූලික ව්‍යාපෘතීන් (Feasibility Study) මගින් ලද අත්දැකීම් අනුව මෙම වැඩසටහන දීප ව්‍යාප්තව සිදුකිරීමට අදහස් කෙරේ. ඒ සඳහා අවශ්‍ය ව්‍යාපෘති යෝජනා මේ වන විටත් අමාත්‍යාංශය වෙත ඉදිරිපත් කර ඇත.

දරන ලද වියදම් නිශ්කාර්ය නොවන ආකාරයටත් ඉදිරියේදී දරන වියදම් ඵලදායි වන ආකාරයට කටයුතු කළ යුතුය.

| | | |
|---|---|---|
| දුෂ්කරතා හේතුවෙන් ගම්පහ හා බදුල්ල දිස්ත්‍රික්කයන්ගේ පිළිවෙලින් ගොවිජන සේවා මධ්‍යස්ථාන 26ක ඉඩම් කැබලි 80,006ක් හා ගොවිජන සේවා මධ්‍යස්ථාන 10ක ඉඩම් කැබලි 27,139කින් සිතියම්ගත කර අවසන් කිරීමට හැකිව තිබුනේ කැබලි 10,825 ක් හා 9,955 ක් පමණි. මාස 07ක කාලයක් පමණක් ක්‍රියාත්මක වී අතරමග නතර කර ඇති මෙම ව්‍යාපෘතිය ඉදිරියට ක්‍රියාත්මක නොකරන්නේ නම් මේ සඳහා මෙතෙක් දරු රු.9,610,720 ක වියදම නිශ්කාර්ය වියදමක් විය හැකි බව නිරීක්ෂණය කෙරේ. | | |
| (ඇ) නොමිලේ රක්ෂණය යටතේ රක්ෂණය හිමි ගොවින්ට වගා හානි වන්දි ගෙවීමට මහා භාණ්ඩාගාරය විසින් අග්‍රිම මුදල් ලබාදීමේ ප්‍රමාදය හේතුවෙන් 2017/2018 මහ හා 2018 යල කන්නයේ වගා හානි වන්දි ගෙවීම වර්ෂයක කාලයක් ප්‍රමාද වී 2019 යල කන්නයේදී සිදුකර තිබුණි. එමෙන්ම 2018/2019 මහ කන්නය වෙනුවෙන් වගා හානි වූ ගොවීන් 20,100 කට අදාළ රු.598,972,934ක වන්දි මුදල් ගෙවා තිබුනේ 2020 පෙබරවාරි එනම් 2019/2020 මහ කන්නයේදීය. මේ අනුව නොමිලේ රක්ෂණ වැඩ සටහනෙහි යම් අකාර්යක්ෂම බවක් නිරීක්ෂණය විය. නිසි කලට වන්දි මුදල් නොලැබීම නිසා කෘෂිකාර්මික හා ගොවිජන රක්ෂණ මණ්ඩලය කෙරෙහි ගොවීන්ගේ විශ්වාසය බිඳවැටී ඇතිබව පොළොන්නරුව, අනුරාධපුරය හා කුරුණෑගල දිස්ත්‍රික්ක ක්ෂේත්‍ර විගණන පරික්ෂාවේදී වැඩිදුරටත් අනාවරණය විය. | කඩිනමින් වන්දි ගෙවීම සඳහා මහා භාණ්ඩාගාරයෙන් මුදල් ඉල්ලීම් සිදුකර ඇති අතර, මුදල් ලද වහාම ගොවීන් වෙත වන්දි මුදල් නිදහස් කිරීමට කටයුතු කරනු ලැබේ. 2020 ජූලි මාසය වන විට 2019/20 මහ කන්නය ද ඇතුළුව එම කන්නයේ ප්‍රතික්ෂේප වූ ගොවීන්ගේ වන්දි හැර ඊට පෙර කන්නයන් සඳහා ද වන්දි ගෙවීම් අවසන් කර ඇත. | කාලීනව වගා හානි වන්දි ගෙවීම් කිරීමට කටයුතු කළ යුතුය. |

| | | |
|---|---|---|
| (ඇ) කෘෂිකාර්මික හා ගොවිජන රක්ෂණ මණ්ඩලය, ලෝක බැංකුවට අනුබද්ධිත ජාත්‍යන්තර මූල්‍ය ආයතනය සමග එක්ව 2016 මැයි 05 සිට 2019 මැයි අතර කාලය තුළ දිස්ත්‍රික්ක 6 ක දර්ශක මත පදනම්වූ රක්ෂණ ක්‍රමවේදයක් සකස්කර ක්‍රියාවට නැංවීම සඳහා ගිවිසුමකට එළඹ තිබුණද 2018/2019 මහ කන්නයේදී වවුනියාව, අනුරාධපුරය, කිලිනොච්චිය හා මුලතිව් යන දිස්ත්‍රික්කවල පර්යේෂණ මට්ටමින් එය ක්‍රියාත්මක කර තිබුණි. හානි තක්සේරුව සඳහා නවීන ක්‍රම හඳුන්වා දීමට දර්ශක මත පදනම් වූ රක්‍ෂණ ක්‍රමවේදය ක්‍රියාත්මක කිරීම මගින් අපේක්‍ෂා කර තිබුණද වවුනියා දිස්ත්‍රික්කයේ පමණක් මෙම ක්‍රමය යටතේ වන්දි ගණනය කර තිබුණි. | මේ වන විට ගම්පහ සහ හම්බන්තොට දිස්ත්‍රික්ක වලද මේ වන විට දර්ශක මත පදනම් වූ රක්ෂණ යෝජනා ක්‍රමය යටතේ වන්දි ගණනය ආරම්භ කර ඇත. එසේම දර්ශක මත පදනම් වූ රක්ෂණ යෝජනා ක්‍රමය යටතේ ගොවි හැඳුනුම්පත් ලබාදීමට මෙතෙක් සැලසුම් කර නොමැත. ඉදිරියේදී විධිමත් ගොවි හැඳුනුම්පතක් නිකුත් කිරීම සම්බන්ධයෙන් මේවන විට සාකච්ඡා කරමින් පවතී. | දිවයිනේ සියලු හානි තක්සේරුවට නවීන ක්‍රම භාවිතා කිරීම මගින් ඉටුකිරීමට හා ගොවි හැඳුනුම්පත් නිකුත් කිරීමටද කටයුතු කළ යුතුය . |
| (ඉ) පශු රක්‍ෂණය යටතේ රක්‍ෂණය කළ ගවයින්ගේ රක්‍ෂණ කාලය ඉකුත් වූ පසුව නැවත එම ගිවිසුම් අලුත් කිරීමට දිස්ත්‍රික් කාර්යාල අවධානය යොමු නොකිරීම පශු රක්‍ෂණ ආදායම අඩුවීමට හේතු වී තිබූ බව කෑගල්ල හා හම්බන්තොට දිස්ත්‍රික් කාර්යාල පරික්ෂාවේදී අනාවරණය විය. කෑගල්ල දිස්ත්‍රික් කාර්යාලය පරික්ෂාවේදී 2017 හා 2018 වර්ෂයේ ගව රක්‍ෂණ ගිවිසුම් 224 න් 64 ක් 2019 වර්ෂයේදී කල්පිරී තිබුණද ඒවායේ රක්‍ෂණය නැවත අලුත්කරවා ගැනීමට කටයුතු කරගෙන නොතිබුණි. | පශු රක්‍ෂණය යටතේ රක්‍ෂණය කළ ගවයින්ගේ රක්‍ෂණ කාලය අවසන් වූ පසුව නැවත එම ගිවිසුම අලුත් කර නොගැනීමේ හේතූන් මේ වන විට හඳුනාගෙන ඇත.<br>ඒ සඳහා ප්‍රධාන හේතුව වී ඇත්තේ මෙම ගවයින් බැංකු ණය මත ලබා දෙන බැවින්, බැංකුවට ඉදිරිපත් කිරීම සඳහා පමණක් රක්‍ෂණය ලබා ගැනීමයි.<br>මීට අමතරව විවිධ වූ රාජ්‍ය නොවන සංවිධාන, ආයතන මඟින්ද ගොවීන් වෙත ගවයින් ලබා දීමේදී සුරැකුමක් වශයෙන් ආරම්භයේදී රක්‍ෂණය ලබා ගන්නා බවද වාර්තා වී ඇත.<br>එයින් පසුව රක්‍ෂණය සම්බන්ධයෙන් ගොවීන්ගේ සැලකීමක් නොවේ.<br>කෙසේ නමුත්, මෙම තත්ත්වයන් හඳුනාගැනීමෙන් අනතුරුව මෙම රක්ෂිතයින් ගිවිසුම අවසන් වීමට මාස 03කට පෙරාතුව ඔවුන් හඳුනාගෙන, මෙම පශු සම්පත් රක්‍ෂණයේ වටිනාකම පැහැදිලිකර දී ඔවුන් ඉදිරි වර්ෂයන් සඳහාද රඳවා ගැනීමේ වැඩපිළිවෙලක් ක්‍රියාත්මක කරන ලෙස දිස්ත්‍රික් කාර්යාල වෙත උපදෙස් | පශු රක්ෂණ ක්‍රමවේද දියුණු කිරීමට කටයුතු කළ යුතුය. |

| | | |
|---|---|---|
| | ලබා දී ඇත. එයට අමතරව මෙම සතුන් ලබා දුන් ආයතන, රාජ්‍ය නොවන ආයතන සහ බැංකු සමඟද ඍජු සබඳතා පවත්වාගෙන යෑම මේ සඳහා විසඳුමක් ලෙස ක්‍රියාත්මක කිරීමට අපේක්ෂා කෙරේ. | |

## 3.4 නිෂ්කාර්ය හෝ ඌන උපයෝජිත දේපළ, පිරියත හා උපකරණ

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) ඇඹිලිපිටියේ පිහිටි නිල නිවාස අවශ්‍ය අලුත්වැඩියාවන් සිදු කිරීමකින් තොරව වර්ෂ 21 කට අධික කාලයක සිට අභාවිතව පවතී. | අදාළ වත්කම් ප්‍රතිසංස්කරණය කර භාවිතා කිරීමට අවශ්‍ය පියවර ගනු ලැබේ. | නිශ්ක්‍රීය වත්කම් ප්‍රතිසංස්කරණය කර භාවිතා කිරීමට අවශ්‍ය පියවර ගත යුතුය. |
| (ආ) මහනුවර, අම්පාර, මනම්පිටිය හා මහව යන දිස්ත්‍රික්කයන්හි කෘෂි රක්ෂණ මණ්ඩලයට අයත් දිස්ත්‍රික් කාර්යාල ඉදිකිරීම සඳහා ප්‍රාදේශීය ලේකම් කාර්යාල මඟින් ඉඩම් පවරාගෙන තිබුණද, එම ඉඩම්වල ගොඩනැගිලි ඉදිකිරීමට කටයුතු නොකර එදින සිට වසර 2-12 දක්වා කාලයක් කුලියට ගත් ගොඩනැගිලිවල කාර්යාල පවත්වාගෙන යමින් තිබුණි. | මෙම ඉඩම් වල අයිතිය නියමාකාරයෙන් පවරාගෙන දිස්ත්‍රික් කාර්යාල ඉදිකිරීම සඳහා අරමුදල් සපයාගෙන ඉදිකිරීමට කටයුතු කරනු ලැබේ | දිස්ත්‍රික් කාර්යාල කඩිනමින් ඉදිකර කුලී ගොඩනැගිලි වලින් ඉවත්වීමට කටයුතු කළ යුතුය. |
| (ඇ) ආයතනය සතු ධාවනය කළ හැකි සංචිත වාහන 07 ක් සඳහා සංචිත රියදුරන් 03ක් පමණක් සිටීම හේතුවෙන් එම වාහන ඌන උපයෝජිත තත්ත්වයේ පැවතිණි. | කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවෙන් අනුමැතිය ඉල්ලුම් කළත් 2020 වර්ෂය සඳහා බඳවාගැනීම් සිදුකිරීමට අනුමත කර නොමැත. එසේවුවත් නැවතත් එම තනතුරු බඳවාගැනීම සඳහා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවට සේවා අවශ්‍යතාවය පිළිබඳව පැහැදිලි කරමින් අනුමත රියදුරු සංඛ්‍යාව බඳවා ගැනීමට අනුමැතිය ලබාදෙන ලෙස ඉල්ලා ඇත. | ප්‍රමාණවත් රියදුරන් බඳවා ගැනීමට කටයුතු කළ යුතුය. |

## 3.5 මානව සම්පත් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) අනාගත මානව සම්පත් අවශ්‍යතා සලකා බලා 2015 ජුලි 30 දිනැති 463/14 අංක දරන අධ්‍යක්ෂ මණ්ඩල පත්‍රිකාවෙන් අනුමත කරන ලද සංශෝධිත බඳවා ගැනීමේ පටිපාටිය (SOR) වර්තමානයට ගැළපෙන ලෙස සංශෝධනය කර කළමණාකරන සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලබා ගැනීමට සමාලෝචිත වර්ෂය අවසන් වන තෙක් කටයුතු කර නොතිබුණි. | මේ වන විට එම අනුමැතිය ලබාගෙන අවුරුදු 05ක් ගතවී ඇති බැවින් සහ මේ වන විට මණ්ඩලයේ කටයුතු පුළුල් වීම නිසා සේවක අවශ්‍යතාවයද බෙහෙවින් ඉහළ ගොස් ඇති බැවින්ද සියලු අවශ්‍යතාවයන් පිළිබඳව අවධානය යොමු කරමින් නව බඳවා ගැනීමේ පටිපාටියක් සම්පාදනය කිරීම සඳහා කටයුතු කරමින් පවතී. එය අගෝස්තු මාසය වන විට අධ්‍යක්‍ෂ මණ්ඩලය වෙත ඉදිරිපත් කිරීමට සැලසුම් කර ඇත. එයින් පසු නව සංශෝධනය කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කර අනුමැතිය ලබාගැනීමට සැලසුම් කර ඇත. | බඳවා ගැනීම පටිපාටිය යාවත්කාලීන කිරීමට පියවර ගත යුතුය. |
| (ඇ) සමාලෝචිත වර්ෂය අවසානයට අනුමත කාර්යමණ්ඩල තනතුරු 421 තුළ මාණ්ඩලික ශ්‍රේණියේ තනතුරු 19 ක්, මාණ්ඩලික නොවන තනතුරු 98 ක් හා කණිෂ්ඨ ශ්‍රේණියේ තනතුරු 22 ක් වශයෙන් පුරප්පාඩු 139 ක සංඛ්‍යාවක් පැවතිණි. මෙම නිලධාරී හිඟය ප්‍රධාන කාර්යාලයේ හා දිස්ත්‍රික් කාර්යාලයන්හි කාර්යාල හා ක්ෂේත්‍ර රාජකාරි කටයුතු කාර්යක්‍ෂමව හා ප්‍රමාදයකින් තොරව ඉටුකිරීමට බාධාවක්වී පැවතිණි. මේ හේතුවෙන් මණ්ඩලය විසින් කොන්ත්‍රාත් නිලධාරින් 13ක් හා දෛනික දීමනා ලබන පුහුණු නිලධාරින් 48 ක් යොදා ගනිමින් ස්ථිර කාර්ය මණ්ඩලයේ කාර්යභාරය ඉටු කරවා ගෙන තිබුණි | පාර්ලිමේන්තු මැතිවරණයෙන් පසු මෙම සියලු පුරප්පාඩු තනතුරු පිරවීම සඳහා පියවර ගනිමින් සිටින අතර මාණ්ඩලික ශ්‍රේණියේ තනතුරු ඉක්මනින් බඳවාගැනීම සඳහා පුවත්පත් දැන්වීම් පළකිරීමට මැතිවරණ කොමිෂන් සභාවේ සභාපතිගේ අනුමැතිය ලබාගෙන ඇති අතර, පුරප්පාඩු සම්බන්ධයෙන් පුවත්පත් දැන්වීම් පළකිරීමට කටයුතු සම්පාදනය කරමින් පවතී. | කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතිය ඇතිව පුරප්පාඩු පිරවීමට කටයුතු කළ යුතු වේ. |